# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## වාර්ෂික වාර්තාව

## 2012

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
තැ.පෙ.1382,
130, ඩබ්ලිව්.ඒ.ඩී.රාමනායක මාවත,
කොළඹ - 03.

2014.06.20

ලේකම්තුමා,

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය,

561/3, ඇල්විටිගල මාවත,

කොළඹ 05.

මහත්මයානනි,

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2012 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා ගිණුම්**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලියකියවිලි සමඟ 2012 වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි.

(අ) 2012 වර්ෂය මූල්‍ය වාර්තා

(ආ) විගණකාධිපති වාර්තා සහ

(ඇ) යථෝක්ත (ආ) පිළිබඳ මණ්ඩලයේ නිරීක්ෂණ

මෙයට,

ඔබ විශ්වාසී වූ,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

*අත්සන් කළේ*
**එන්. එස්. එම්. සම්සුඩීන්,**
**සභාපති**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව


| | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 01-03 |
| 02. | ආයතන තොරතුරු | 04-05 |
| 03. | මානව සම්පත් පිරිස් බලය | 06 |
| 04. | ගණකාධිකරණ ප්‍රතිපත්ති | 07-08 |
| 05. | මූල්‍යතත්ව ප්‍රකාශනය – 2012 | 09 |
| 06. | විස්තීර්ණආදායම් ප්‍රකාශය - 2012 | 10 |
| 07. | හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය | 11 |
| 08. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 12 |
| 09. | ගිණුම් පිළිබඳ සටහන් | 13-15 |
| 10. | විගණන කමිටුවේ වාර්තාව | 16-24 |
| 11. | මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම | 25-34 |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012 වර්ෂය සඳහාවූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

### 1.0 පසුබිම

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ පුරෝගාමියා වේ.

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1955 අංක 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපිත කරන ලදි.

ඉන් පසුව 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01 වන දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් ප්‍රතිෂ්ඨාපිත කෙරිණි.

1980 වර්ෂයේදී අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගින් එහි නම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වශයෙන් සංශෝධනය කරන ලදි. කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වධෑ මෙම සංස්ථාව 1985 පෙබරවාරි 01 වන දින සිට පලාත් පාලන,නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරන ලදි. ඉන්පසුව 1997 ජුනි 19 සිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතට සංස්ථාව පත්කරන ලදුව 2010 අප්‍රේල් මස දක්වා අඛන්ඩව එම අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන අවුත් ඉන්අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කරන ලදි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ රු. 1,083,618,910 ක් ආයෝජනය කර ඇති අතර එම සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 62.45% ක් හිමිකරගන ඇත. කොටසක සම මිල රු. 10/- වේ. කෙසේ වුවද මෙම කොටස් මිල 2009, 2010 කාලය තුල සැලකිය යුතු ලෙස ඉහල ගොස් ඇත්තේ උතුරු ප්‍රදේශයේ පැවති අර්බුධකාරී තත්වයන් පහව යාමේ ප්‍රතිඵලයක් ලෙසය. මෙම කොටස් වල උපරිම වෙළඳපළ අගය ලෙස රු. 34.75 සටහන් වූ අතර වර්ෂ 2011 දී මෙම කොටස් වල වටිනාකම රු. 26.20 දක්වා පහළ වැටුනි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරින් සිමෙන්ති සමාගමේ එකක් රු.10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 320,000/- ක් හිමිව ඇති අතර, 1995 දෙසැම්බර් 31 දින සංස්ථාව සතුව තිබූ සෑම කොටස් දෙකකටම එක් සාමාන්‍ය කොටස බැගින් ප්‍රසාද කොටස් නිකුත් කිරීම තුලින් වාසියක් ලැබීම නිසා දැනට සීමාසහිත මහවැලි මෙරින් සිමෙන්ති සමාගමේ සාමාන්‍ය කොටස් 480,000ක් සංස්ථාව සතුව පවතී. එය මුළු කොටස් හිමිකමෙන් 10%ක් වේ. මෙම ආයෝජනයෙන් සිමෙන්ති සංස්ථාව 1999 තෙක් ඉතා ඉහල ප්‍රතිලාභයක් (ලාභාංශ) ලබා ඇත. ඉන් අනතුරුව වසර 2004 හැර ලෆාර්ජ් මහවැලි සිමෙන්ති සමාගමෙන් කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව ලබා නැත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කම්හල සහ රුහුණු සිමෙන්ති කම්හල ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටි කඩදාසි මලු ඒකකයේ අයිතිය මහා භාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතුව පවතින්නේ උතුරේ ආරක්ෂක තත්වය මත 1990 ජුනි මාසයේ සිට අක්‍රියව පවතින කන්කසන්තුරේ සිමෙන්ති කම්හල පමණි. කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ සේවා නියුක්ති සේවකයින්ට වැටුප් ගෙවීම 2001 මාර්තු මාසය දක්වා මහා භාණ්ඩාගාරයෙන් කරන ලද නමුත් 2001 අප්‍රේල් මස සිට එය අත් හිටුවන ලදි. සංස්ථාව මුහුණ පා ඇති අතිවිශාල අර්බුදය වන්නේ මෙම සේවක වැටුප් සඳහා මුදල් සොයා ගැනීමයි.

2003 සහ 2005 යන වර්ෂයන්හි රජය විසින් ස්වෙච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ පිළිවෙලින් සේවකයින් 173ක් සහ 21ක් විශ්‍රාම යන ලදි. මහාභාණ්ඩාගාරය විසින් මෙම විශ්‍රාම ගැන්වීම සඳහා පිලිවෙලින් රු.මිලියන 49.18 ක් සහ 8.51ක් ලබා දෙන ලදි.

## 2.0 වර්තමාන තත්ත්වය

### *(අ) සිමෙන්ති අලෙවිය :*

අවම මිලකට, ඉහළ ගුණාත්වයකින් යුතු වු සිමෙන්ති අවසාන පාරිභෝගිකයා වෙත සැපයීම සංස්ථාවෙහි මෙහෙවර වන අතර, සංස්ථාව 2008 වසරෙහි අගභාගය වන විට සිමෙන්ති වෙළෙඳපොලට ඇතුල්වීමත්, සමග 2009 වසරේදි එම තත්ත්වය ලගාකර ගැනිමට හැකිව තිබුණි. 2009 වසර තුලදි සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 84,308 ක් සංස්ථාව විසින් පකිස්ථානයෙන් ආනයනය කර ඇති අතර, එය "කන්කේසන්" යන වෙළඳනාමයෙන් වෙළඳපල තුල බෙදා හරින ලදි. 2010 වසර තුළදි සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්‍රික් ටොන් 36,260 ක් කන්කේසන් යන වෙළඳ නාමය යටතේ සංස්ථාව විසින් පාකිස්ථානයෙන් ආනයනය කරන ලදි. 2011 වසර තුළදීද සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 58,352 ක් ආනයනය කරන ලද අතර 2012 වසර තුළදීද සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 28,249 ක් ආනයනය කරන ලදි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති වෙළෙඳපොලට පිවිසිමත් සමඟම පෞද්ගලික අංශයෙහි සිමෙන්ති කර්මාන්තය සඳහා සම්බාධක පැනවීම තුලින් සංස්ථාව මෙම දිනවල වාසි/සහන ලබාගෙන තිබෙන අතර, විවිධ ප්‍රතිපත්ති දියත් කිරීම හරහා මිල ගනන් අඩු කිරීම තුලින් අඩුවන ඉල්ලුම සඳහා විකල්ප උපායමාර්ග මගින් ලාභදායිත්වය ඉහල නංවා ගැනිමට පියවර ගෙන තිබෙයි.

කෙසේ වුවත් සිමෙන්ති අලෙවි ක්‍රියාවලියෙන් සංස්ථාව මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබීමට නොහැකි වූයේ අනෙකුත් තරඟකාරි ආයතන වලින් එල්ල වු බොහෝ බාධක නිසාය.

### *(ආ) කොන්ක්‍රිට් නිපැයුම් නිෂ්පාදනය හා අලෙවිය :*

1997 ඔක්තෝබර් මාසයේදි සංස්ථාව විසින්, කොන්ක්‍රිට් නිෂ්පාදනය උරුම්පිරායිහි ආරම්භ කර තිබේ. මෙම ඒකකය ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන සඳහා කොන්ක්‍රිට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි යෙදි ඇත. කෙසේ වුවද වර්ෂ 2006 මැද භාගයේ සිට 2008 මුල් භාගය වන තුරු මෙකී නිෂ්පාදන දැනට පවතින වාතාවරණය සහ අමුද්‍රව්‍ය සපයාගැනිමේ අපහසුතාවය හේතුවෙන් අඩු කිරීමට සිදුවිය.

2009 වසරේදි සම්පූර්ණ නිෂ්පාදනයක් පැවති අතර 3312 පමණ වු ආධාරක කණු නිපදවා ලංකා විදුලිබල මණ්ඩලයට හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සපයන ලදි. කොන්ක්‍රිට් ගල්වලට අමතරව තලාංඥ පදික වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්ව විද්‍යාලට සහ සාමාන්‍ය මහජනතාව වෙත නිකුත් කරන ලදි. වර්ෂ 2010 දි පූර්ණ නිෂ්පාදනයේ ප්‍රතිඵලයක් ලෙස කොන්ක්‍රිට් කනු 2117 ක් ද පන්තල් කණු 4505 නිපදවීමට හැකිවු අතර 2011 වසරේදි ද කොන්ක්‍රිට් කණු 1918 ක් සහ පන්තල්කණු 1892 ක් නිපදවන ලදි.2012 වසරේදි ද කොන්ක්‍රිට් කණු 2,687 ක් නිපදවන ලදි.

## *3.0 ලාභදායිත්වය :*

වර්ෂ 2009 දි රු මිලියන 1.07 ක ආදායමක් සංස්ථාව වෙත ලැබි තිබේ. කෙසේ නමුත්, වැළැක්විය නොහැකි සාධක මත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අලාභදායි තත්ත්වයට පත්විය. තවදුරටත් සංස්ථාව කල්බදුකරණය තුලින් ලැබෙන කුලිය සහ තැන්පතු තුලින් ලැබෙන පොලි වැනි වෙනත්, මෙහෙයුම් ආදායම් රු.මිලියන 28.8 ක් ඉපයිය.

2009 වසරේදි සංස්ථාව රු.මිලියන 79.03 ක ශුද්ධ අලාභයක් සියලු මෙහෙයුම් සහ පරිපාලන වියදම් ඇතුලුව උපයාගෙන ඇත. 2010 වසරේදි සංස්ථාවට බැංකු ණය පොලි අඩු කිරීමෙන් අනතුරුව රු.මිලියන 5.074 ක ශුද්ධ ලාභයක් සංස්ථාව උපයා ගෙන ඇත. 2011 වර්ෂයේදි ද සංස්ථාව රු.මිලියන 2.6 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇත.

කෙසේ නමුත්, නඩු අංක 077755/21 යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගොනු කල නඩුව සම්බන්දව සිමෙන්ති මලු 13,000 ක් ගල් වු සිමෙන්ත ලෙස ඉවත් කිරිමට සංස්ථාවට සිදු විය. මෙමගින් ආයතනයට සිදු වු අලාභය රු.මිලියන 9.1 ක් වන අතර එය පරිපාලන වියදමක් ලෙස ආදයම් වාර්තාවේ හඳුනා ගෙන ඇත. ඉන් පසු මාස 3 ක කාලයක් සිමෙන්ති ආනයනය කිරිමේ කටයුතු නවතා දමා තිබු අතර එම කාල සිමාව තුල බැංකු ගෙවීම් අතපසු විම තුල ගෙවිය යුතු ණය පොලිය හා අනෙකුත් වියදම් ඉහල යන ලදි.

තවද, අමාත්‍ය මණ්ඩල තිරණයන් අනුව ඉටාල් ට්‍රේඩ් අයතනයට ගෙවිය යුතුව තිබු රු.මිලියන 40 ක මුදල ලංකා බැංකුවෙන් ණය මුදලක් ලබා ගෙන පියවන ලදි. මීට අදාල සම්පුර්ණ පිරිවැය මෙම වසරේ වියදමක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ පිරිවිතරයන්ට අනුකුලව සිදු කරන ලදි.

### *4.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්ය භාරය*

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම කම්හල වන කන්කසන්තුරේ සිමෙන්ති කම්හල තාවකාලිකව වසාදමා තිබෙන බැවින් දැනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති නිෂ්පාදන කටයුතු වල නිරත නොවේ. කෙසේ වුවද නුදුරු අනාගතයේදි කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කරිමේ ප්‍රවනතාවය පිළිබඳව පුරෝකථනයක් ගැන අනාවැකි කීමද අපහසුය.

සංස්ථාවේ මුලික වගකිම වන්නේ කන්කේසන් සිමෙන්ති කම්හල නැවත ආරම්භ කිරිමේ කාර්යය සහතික කිරිමය. මෙම කරුණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවල යම් උත්සාහයන් දරන ලද අතර, එහිදි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරිමට ඇති හැකියාව පිළිබඳ විස්තීර්ණ අධ්‍යයනයක යෙදුණි. අවශ්‍ය වාර්තා ඉදිරිපත් කෙරුණු අතර, කම්හලේ ආරක්‍ෂාව පිලිබඳව පුර්ණ සහතිකයක් ලැබුණහොත් ඒවා ක්‍රියාත්මක කිරිමට ශක්‍යතාවක් ඇති තත්වයක පවත්නා බවට කරුණු හෙලිවින.

ශ්‍රිලංකා සිමෙන්ති සංස්ථාවේ කලමනාකාරිත්වය නව සිමෙන්ති ඇසුරුම් යන්ත්‍රාගාරයක් සුදුසු ප්‍රදේශයක මෙම වසරතුලදි ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් පවති. මෙහිදි අඩු පිරිවැයකට උසස් ගුණාත්මක බැවින් යුතු සිමෙන්ති මහජනතාවට සැපයිම සංස්ථාවේ මුලික අරමුණ වි තිබේ.

පුත්තලම පලාවි සිමෙන්ති කර්මාන්තශාලාව ආශ්‍රිතව ඇති කැලෑබද ඉඩමේ කජු වගා කිරිමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. පොලිස් දෙපාර්තමේන්තුවෙන් සංස්ථාව වෙත පවරා ගන්නා ලද කොළඹ 03, ගාලුපාරෙහි අංක 287 හි පිහිටි සංස්ථාව සතු ඉඩම සඳහා බැංකු වලින් ලබාගන්නා මුල්‍ය ප්‍රතිපාදන වන මහල් 25කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇත, මේ සඳහා වු වාස්තු විද්‍යාත්මක නිර්මාණයකට අනුව මුල් මහල් 04 රථ ගාල් සඳහා ඉතිරි මහල් මනාසේ උද්‍යාන අලංකරණය කළ මහල් ගොඩනැගිල්ලක් වශයෙන් නිම කිරිමට රු. බිලියන 4500 ක් ඇස්තමේන්තු කර ඇත. මෙම ඉඩම හොටෙල් ව්‍යාපෘතියක් සඳහා චින ජාතික ආයතනයක් වන ජාතික ඉලෙට්‍රොනික උපකරණ සංස්ථාව සමඟ එම්.ඕ.යු 2012 වසරේ අත්සන් කරන ලදි.මෙම ව්‍යාපෘතියක් සඳහා ඇස්තමෙන්තු ගත පිරිවැය ඇ.ඩොලර් 60,000,000.

### *5.0 සේවය ඇගයීම*

වර්ෂ 2012 දි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ උන්නතිය, සංවර්ධනය, මෙහෙයුම් කාර්යයන් වෙනුවෙන් ලබා දෙන ලද සහයෝගය හා වටිනා උපදෙස් වෙනුවෙන් කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍යතුමා, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන ගරු අමාත්‍යතුමා, රේඛීය අමාත්‍යාංශයේ, මහාභාණ්ඩාගාරයේ, ප්‍රමිති ආයතනයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, රාජ්‍ය බැංකු, අනෙකුත් රජයේ ආයතන, සිමෙන්ති නිෂ්පාදන ආයතන යන ආයතනයන්හි නිලධාරින්ටත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙ ගෞරවනිය ස්තුතිය පුදකර සිටිමු.

එසේම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවකයන් එහි උන්නතිය හා සංවර්ධනය වෙනුවෙන් ලබා දෙනු ලැබු සේවයද අගය කරන බව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටි.

# 2012 වර්ෂයේ ආයතනයේ කාර්ය සාධනය පිළිබඳව සභාපතිගේ වාර්තාව

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වර්තමානයේ සිමෙන්ති ආනයනය කොට සාධාරණ මිල ගණන් යටතේ බෙදාහැරීම ප්‍රධාන කාර්ය ලෙස සිදුකරන අතර කන්කසන්තුර සිමෙන්ති කම්හලෙහි දැනට සේවයේ නියුතු සේවකයින් යොදවා ගෙන සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේද නියුක්ත වෙයි.

සිමෙන්ති ආනයනය කොට බෙදාහැරීමේදී 2012 වර්ෂය තුළ සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්‍රික් ටොන් 28,249ක් ආනයනය කර බෙදාහරින ලදී. කොන්ක්‍රීට් නිපැයුම් 2,687ක් වේ.

2012 වර්ෂයේ මුළු ඉපැයුම රු.361,933,000 වූ අතර දැරීමට සිදුවූ දළ අලාභය 10,603,000කි. එසේම ශුද්ධ අලාභය වශයෙන් රු.70,383,000ක් දැරීමට සිදුවිය. මෙය පෙර වසරට සාපේක්ෂව පිරිහීමක් පෙන්නුම් කළද ඊට බලපෑ අයහපත් තත්වයන් ලෙස පහත දැ නිරීක්ෂණය කළ හැකි විය.

- සිමෙන්ති ආනයනය කිරීමේදී ලංකා බැංකුවෙන් ණය පදනම මත ණයවර ලිපි ලබාගනිමින් සිමෙන්ති ගෙන්වීමේදී ගෙවිය යුතු වන මුදලට අදාළ පොලිය සෘජු පිරිවැයක් ලෙස සලකා විකුණුම් පිරිවැය තුළ අන්තර්ගත වීම හේතුවෙන් දළ අලාභයක් පෙන්නුම් කරයි.

- එසේම සිමෙන්ති ආනයනය කිරීමේදී සැපයුම්කාර සමාගමට ගෙවිය යුතු මිළ ගණන් ඉහළ දැමීමත් ඊට සාපේක්ෂව විකුණුම් මිල ගණන් ඉහළ දැමීමට තරඟකාරි වෙළඳපොල තුල අවකාශ නොමැති වීම මීට සෘජුවම බලපාන ලදී.

- 2012 වර්ෂයේ සීමිත ගබඩා පහසුකම් හේතුවෙන් නිසි ගබඩා කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවය නිසා සිමෙන්ති ගල්වීමත් ඊට පාරිභෝගික අධිකාරිය මැදිහත් වී නඩු පැවරීමත් හේතුවෙන් සිදුවූ රු.මිලියන 9ක අලාභයද මීට බලපාන ලදී.

- අමාත්‍ය මණ්ඩල තීරණයන් අනුව අන්තර්ජාතික සමාගමක් වන ඉටාල් ට්‍රේඩ් ආයතනය වෙත ගෙවීමට සිදුවූ රු.මිලියන 39ට අදාල වියදම පරිපාලන වියදම් තුළ අන්තර්ගත වන අතර ශුද්ධ අලාභයක් දැරීමට එයද බලපාන ලදී.

- යුධමය වාතාවරණය නිමවීමත් සමඟ, කන්කසන්තුරෙයිහි නිෂ්පාදනය කළ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය සඳහා තරඟකාරි ආයතන බිහිවීමත් සමඟ අප නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම පහත බැසීමත්, එහි සේවයෙහි නියුතු 31 දෙනෙකුට අදාල වැටුප් හා අනෙකුත් වියදම් දැරීමට සිදුවීම යන හේතූන්ද මෙම ශුද්ධ අලාභය ලැබීමට හේතු වේ.

- ආයතනයෙහි පවතින අනෙකුත් බැංකු ණය සහ බැංකු අයිරාවන්ට අදාළ පොලී වියදමද මීට බලපාන ලදී.

ඉහත සඳහන් අයහපත් තත්වයන් තුළද, 2012 වර්ෂයේ මැද භාගයේ පත් වූ මා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ සංස්ථාවේ නිලධාරින්ගේ පූර්ණ සහයෝගය සහ සියළු දෙනාගේ කැපවීම සහ මනා කළමනාකරණය හේතුවෙන් වඩාත් ස්ථායී සහ ඵලදායී ආයතනයක් ලෙස සංවර්ධනය කරා ලඟාවීමට කටයුතු සිදුකරමින් පවතී.

*අත්සන් කළේ*
**එන්. එස්. එම්. සම්සුඩීන්,**
**සභාපති**
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**2008 - 2012 දක්වා වූ වර්ෂ සඳහා**

**ආදායම් වියදම් ප්‍රකාශය**

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| ආදායම් | 361,933 | 656,071 | 410,709 | 1,070,591 | 126,848 |
| විකුණුම් පිරිවැය | (372,536) | (656,676) | (406,508) | (1,136,970) | (125,029) |
| **දළ ලාභය/ (අලාභය)** | **(10,603)** | **(605)** | **4,201** | **(66,379)** | **1,819** |
| වෙනත් ආදායම් | 33,330 | 35,623 | 34,846 | 28,889 | 43,619 |
| බෙදා හැරීම් වියදම් | (5,776) | | | | |
| පරිපාලන වියදම් | (72,540) | (20,873) | (33,973) | (41,883) | (36,940) |
| මූල්‍ය පිරිවැය | (14,749) | (11,545) | - | - | - |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **(70,338)** | **2,600** | **5,074** | **(79,373)** | **8,498** |
| බදු පිරිවැය | - | - | - | - | - |
| **බදු පසු ලාභය/ (අලාභය)** | **(70,338)** | **2,600** | **5,074** | **(79,373)** | **8,498** |

වරහන් තුළ ඉදිරිපත්වනුයේ අඩු කිරීමය.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**වසර 5ක දෙසැම්බර් 31 වන දිනට**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය**

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| <u>ස්ථාවර වත්කම්</u> | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 547,396 | 550,705 | 543,939 | 544,440 | 544,351 |
| දීර්ඝ කාලීනව ලැබිය යුතු දෑ | 757,224 | 757,224 | 757,224 | 757,224 | 757,224 |
| පරිපාලන සම්ගම් වල ආයෝජනයන් | 1,090,019 | 1,090,019 | 1,090,019 | 1,090,019 | 1,090,019 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 28,860 | 25,526 | 68,123 | 44,593 | 40,361 |
| | **2,423,499** | **2,423,474** | **2,459,305** | **2,436,276** | **2,431,955** |
| <u>ජංගම වත්කම්</u> | | | | | |
| තොග | 22,843 | 20,532 | 28,689 | 10,098 | 67,163 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 81,796 | 76,972 | 119,074 | 134,399 | 73,540 |
| ඉදිරියට කළ ගෙවීම් | 244 | 1,248 | 589 | 443 | 1,210 |
| මුදල් හා මුදල් සමාන දෑ | 3,084 | 14,071 | 9,762 | 3,220 | 1,047 |
| | **107,967** | **112,823** | **158,114** | **148,160** | **142,960** |
| **මුළු වත්කම්** | **2,531,466** | **2,536,297** | **2,617,419** | **2,584,436** | **2,574,915** |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| <u>අරමුදල් හා සංචිත</u> | | | | | |
| නිකුත් කළ ප්‍රාග්ධනය | 966,972 | 966,972 | 966,972 | 966,972 | 966,972 |
| පොදු සංචිත | 9,997 | 9,997 | 9,997 | 9,997 | 9,997 |
| ප්‍රත්‍යාගණන සංචිත | 536,119 | 536,119 | 536,119 | 536,119 | 536,119 |
| සමුච්චිත ලාභ/ අලාභ | 301,597 | 372,864 | 372,219 | 367,144 | 446,518 |
| | **1,814,685** | **1,885,952** | **1,885,307** | **1,880,232** | **1,959,606** |
| <u>ස්ථාවර වත්කම්</u> | | | | | |
| දිගු කාලීන වගකීම් | 546,177 | 492,426 | 492,426 | 492,426 | 492,426 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | 17,796 | 18,919 | 18,783 | 20,807 | 22,418 |
| | **563,973** | **511,345** | **511,209** | **513,233** | **514,844** |
| <u>ජංගම වගකීම්</u> | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 124,791 | 62,857 | 61,730 | 38,849 | 42,538 |
| පොලී ගෙවිය යුතු ජංගම වගකීම් | 1,161 | 53,665 | 147,775 | 152,122 | 57,927 |
| මුදල් හා මුදල් සමාන දෑ | 26,916 | 22,478 | 11,398 | - | - |
| | **152,868** | **139,000** | **220,903** | **190,971** | **100,465** |
| **මුළු හිමිකම් හා වගකීම්** | **2,531,526** | **2,536,297** | **2,617,419** | **2,584,436** | **2,574,915** |

# විගණක කමිටුවේ වාර්තාව 2012

සංස්ථාවේ විගණක කමිටුව විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනකුගෙන් සමන්විතයි. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක්ද නිරීක්ෂකවරු ලෙස සිටියහ. සමාලෝචිත වසරේ එස්.එම්.පියතිස්ස මහතා කමිටුවේ සභාපති වශයෙන් සිටියහ. විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වන ඩබ්.ජේ.හඳපාන්ගොඩ මහත්මිය සහ පියසේන මහතා කමිටුවේ වෙනත් සාමාජිකයෝ වශයෙන් 2012 ජූනි 30 වැනිදා දක්වා සිටි අතර 2012 ජූලි 20 වැනි දින සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන්ගේ මාරු වීමත් සමඟ එල්.අබේනායක සහ ඒ.ජයසිංහ යන මහත්වරුන් විසින් විගණක කමිටුව සමන්විත විය. විගණක කමිටුවේ වගකීම් සහ කාර්යභාරය පහත සඳහන් වේ.

අ) වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා වෙනත් අදාල නීතිමය තත්ත්වයන් වලට අනුකූලව සකස් කර තිබේද පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම.

ආ) අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබෙන්නේ ද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දී දැනුවත් කිරීම.

ඇ) අභ්‍යන්තර සහ බාහිර විගණක වාර්තා සහ COPE වාර්තාවන්හි උපදෙස් සලකා බැලීම සහ එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ උපදෙස් සැපයීම.

ඈ) අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වාදීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලෝචිත වසරේදී විගණන කමිටුව විසින් වෙනත් කාර්යයන් සමඟ පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මූල්‍ය වාර්තා පරීක්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මූල්‍ය වාර්තා පරීක්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන විගණක වාර්තා පිරික්සීම සහ කළමනාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ පරීක්ෂා කිරීම.

*අත්සන් කළේ*
**එස්.එම්.පියතිස්ස**
**සභාපති**
**විගණන කමිටුව**

## සංස්ථාව පිළිබඳ තොරතුරු

**ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,

තැපැල් පෙට්ටිය 1382,

අංක 130, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත,

කොළඹ 02.

**පාලිත සමාගමේ ලියාපදිංචි කාර්යාලය**

සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම

7වන මහල,රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල,

130, ඩබ්ලිව්.ඒ.ඩී.රාමණායක මාවත,

කොළඹ 02.

දුරකථන අංක : 2440201, 2440211, 2440212 දුරකථන අංක : 2447746, 254158

ෆැක්ස් අංකය : 2448866

**කම්හල**

කන්කේසන් සිමෙන්ති කම්හල

කන්කසන්තුරේ

දුරකථන අංකය : 021-3215340

021-3215341

**කම්හල**

කිරමලේ පාර,

කන්කසන්තුරේ

**කොන්ක්‍රිට් ව්‍යාපෘතිය, යාපනය.**

සිමෙන්ති කම්හල,

කන්කසන්තුරේ.

දුරකථන අංක : 021-3215340/41

**සිමෙන්ති ගබඩාව**

472, ශ්‍රී සංඝරාජ මාවත,

කොළඹ.

දුරකථන අංක :011-3030041 ෆැක්ස් :011-4923959

**බැංකුකරුවෝ**

මහජන බැංකුව

ලංකා බැංකුව

**විගණකවරු**

රාජ්‍ය විගණකාධිපති

කොළඹ 07

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**2012 වසර සඳහා පහත දැක්වෙන අධ්‍යක්ෂකවරුන් කළමනාකරන මණ්ඩලය ලෙස පත්කර ඇත.**

| | | |
|---|---|---|
| 01. එන්.එස්.එම්.සම්සුධීන මහතා | සභාපති | 2012.07.26සිට |
| 02.ජේ.කේ.එන්.සී.පේරේරා මහතා | ක්‍රියාකාරි අධ්‍යක්ෂක | 2012.07.26 සිට |
| 03.අර්ජුන ජයසිනහ මහතා | අධ්‍යක්ෂ | 2012.07.26 සිට |
| 04.සී.ජෙ.විජේසේකර මහතා | අධ්‍යක්ෂ | 2012.07.26 සිට |
| 05.ලාල් අබේනායක මහතා | අධ්‍යක්ෂ | 2012.07.26 සිට |
| 06.ඩී.ඩී.අමරතුංගමහතා | අධ්‍යක්ෂ | 2012.07.26 සිට |
| 07.එස්.එම්.පියතිස්ස මහතා | අධ්‍යක්ෂ | 2012.07.26 සිට |

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| 01 එස්.සෙල්වකුමාර් මහතා | සැපයුම් නිලධාරි | ප්‍රධාන කාර්යාලය |
| 02 සී.අයි.කරුණාතිලක මෙනවිය | ගණකාධිකාරි | ප්‍රධාන කාර්යාලය |
| 03 පී.එස්.ඩී.ප්‍රනාන්දු මහත්මිය | විගණන නිලධාරි | ප්‍රධාන කාර්යාලය |
| 04 පී.විමලදාස් | සහකාර ඉංජිනේරු(කොන්ක්‍රිට් ව්‍යාපෘති) | යාපනය කාර්යාලය |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

| වර්ගය | ප්‍රධාන කාර්යාලය | කොන්ක්‍රීට් ව්‍යාපෘතිය | එන්.ඊ.එම්.ඔ. | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමණාකරන | 03 | - | - | 03 |
| කණිෂ්ඨ කළමණාකරන | 05 | 01 | 01 | 07 |
| කළමණාකරන සහකාර | 12 | 04 | - | 16 |
| ප්‍රාථමික මට්ටම | 08 | 30 | - | 38 |
| **එකතුව** | **28** | **35** | **01** | **64** |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## ගණකාධිකරණ ප්‍රතිපත්ති

**01. පොදු ගණකාධිකරණ ප්‍රතිපත්ති :**

සංස්ථාවේ ගණකාධිකරණ ප්‍රතිපත්ති පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලය. ගිණුම් වලට බලපානු ලබන උද්ධමනකාරී සාධක සම්බන්ධයෙන් ගැලපීම් කර නොමැත.

**2.0 විදේශ විනිමය පරිවර්තනය :**

සියලු විදේශ ගණුදෙනු පරිවර්තනය කර ඇත්තේ ගණුදෙනු ක්‍රියාත්මකවූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුවය.

**3.0 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම :**

3.1 ස්ථාවර වත්කම් හා ක්ෂයවීම් :

ස්ථාවර වත්කම් පිරිවැය අනුව හෝ තක්සේරුව අනුව සමස්ථ ක්ෂය අඩුකර ප්‍රකාශිතය.

3.2 ක්ෂයවීම් :

මුල පරිවැය හෝ සෘජු රේඛීත ක්‍රමයක් මත ගණන් බැලූ වටිනාකම, වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානයේදී එම වත්කම් ලේඛණ වලින් ඉවත් කිරීම පදනම් කර ගෙන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.3 වත්කම් මිලදී ගත් වර්ෂය තුල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

3.4 සින්නක්කර ඉඩම් සඳහා ක්ෂයවීම් ප්‍රතිපාදන සලසා නැත.

3.5 ක්ෂයවීම් සඳහා අය කිරීම් අනුපාතයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 6.67% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 12.5% |
| පස් කපන හා බර උපකරණ | 25.0% |
| මොටර් වාහන | 25.0% |
| සවිකිරීමේ නොකල මෙවලම් සහ චංචල උපකරණ | 25.0% |
| සවිකිරීමේ උපාංග සහ ගෘහ භාණ්ඩ | 25.0% |
| දුම්රිය සහ මාර්ග | 10.0% |

3.6 ප්‍රාග්ධනීකරණය

වටිනාකම රු.10,000/- කට අඩු මෙවලම්, සවිකිරීම්, සහ උපාංග ප්‍රාග්ධනිකරණය නොකර ඇති අතර, ඒ වෙනුවට මිලදී ගත් වර්ෂයේ ලාභ අලාභ ගිණුමට අය කෙරෙන ලෙස දක්වා ඇත.

3.7 ආයෝජන

වාර්තාගත වන කොටස් මිලගණන්හි උච්චාවචනයන් හේතුවෙන්, ලැයිස්තුගත සමාගම්හි කොටස් වල කෙරෙන දිගුකාලීන ආයෝජනයන්හි කොටස් මිල ගණන් නාමික අගයට හෝ පිරිවැයට පවත්වා ගෙන යනු ලබයි.

කෙටි කාලීන ආයෝජනයන් වෙළෙඳ පල වටිනාකමට පවත්වා ගෙන යාම සඳහා නියම කර ඇත.

3.8 තොග සහ කෙරෙමින් පවතින වැඩ

තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත් මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු තක්සේරු කරනු ලබයි.

3.9 ණයගැතියෝ :

බොල් ණය සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩුකොට ඉන්වොයිස් වටිනාකම අනුව වෙළඳ හා විවිධ ණයගැතියෝ දක්වා ඇත.

**4.0 බැරකම් හා ප්‍රතිපාදන :**

4.1 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක. 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු වන පාරිතෝෂික වෙනුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.

4.2 සම්භාව්‍ය බැරකම් :

ශේෂ පත්‍රයේ දිනයට පවතින සම්භාව්‍ය බැරකම් සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නැති අතර ඒවා පිළබඳ විස්තර ගිණුම් වලට අදාල සටහන් වලින් අනාවරණය කර ඇත.

4.3 කෙටිකාලින බැරකම්

මාස 12 ක පමණ, කෙටි කාලයක් සඳහා ලබා ගෙන ඇති කෙටි කාලින ණය පහසුකම් ලෙස සියලුම ගෙවීම්, ආනයන සඳහා වූ බැංකු ණය, බැංකු අයිරා පහසුකම් හඳුනාගත හැක.

4.4 දිගුකාලින බැරකම්

මාස 12 කට වඩා වැඩි කාලයක් තුලදි ගෙවීම සඳහා ලබාගෙන ඇති සියලුම බැරකම් දිගුකාලින බැරකම් වේ.

**0.5 ලාභ සහ අලාභ**

5.1 පිරිවැටුම :

වීරිවැටුමෙන් පෙන්නුම් කරනු ලබන්නේ පාරිභෝගිකයන්ට කල විකුණුම් සහ සංස්ථාවේ අභ්‍යන්තර පරිභෝජන අදහසින් කරන ලද විකුණුම්ය.

5.2 විකුණුම් පිරිවැය

ගැනුම් පිරිවැය, රක්ෂණ වියදම්, ප්‍රවාහන පිරිවැය ඇතුලත් ආනයනික පිරිවැය, රේගු ගාස්තු, ශ්‍රී ලංකා වරාය අධිකාරි ගාස්තු, නැව් සේවා ගාස්තු, බහාලුම් ඇසුරුම් ගාස්තු, ප්‍රවාහන ගාස්තු, පැටවීමේ හා බෑමේ කුලි, රඳවාගැනීමේ පිරිවැය, මූල්‍ය පිරිවැය, තොග හානි වීම් පිරිවැය, තොග හිගවීමේ පිරිවැය සහ වෙනත් සෘජු පිරිවැයන්ගෙන් විකුණුම් පිරිවැය සමන්විත වේ.

5.3 වියදම්

වර්ෂයක් තුලදි දරන ලද හා ගෙවීම සඳහා බැදි සිටින සියළුම පරිපාලන, නිෂ්පාදන හා අලෙවිකරණය හා සම්බන්ධවන සියළුම වක්‍ර වියදම් අන්තර්ගත වේ.

5.4 ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය

සංස්ථාවේ ආදායම් බද්දෙන් පසු ලාභය තිරණය කර තිබෙන්නේ, බොල්ණය සහ අඩමාන ණය හෙලිදරව් වූ සියලුම බැරකම්, තොග ගැලපීම සහ ස්ථාවර වත්කම් ක්ෂය වීම සඳහා ප්‍රතිපාදන සැලැස්මෙන් පසුවය.

එමෙන්ම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමෙන් සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදි දරන ලද සියලු වියදම් අයකර ගැනිමෙන් පසුවය.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

*රු '000*

| | සටහන | 2012 | 2012 | 2011 | 2011 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ප්‍රවර්තනය නොවන වත්කම්** | | | | | |
| දේපළ, යන්ත්‍ර හා උපකරණ | 1 | 547,396 | | 550,705 | |
| කාලීන ලැබිය යුතු | 2 | 757,224 | | 757,224 | |
| පාලිත සමාගම් වල ආයෝජන හාවෙනත් | 3 | 1,090,019 | | 1,090,019 | |
| වෙනත් මූල්‍ය වත්කම් | | 28,860 | | 25,526 | |
| | | | **2,423,499** | | **2,423,474** |
| **ප්‍රවර්තන වත්කම්** | | | | | |
| තොගය | 4 | 22,843 | | 20,532 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 5 | 81,796 | | 76,972 | |
| පූර්ව ගෙවීම් | | 244 | | 1,248 | |
| මුදල් හා මුදල් සමක | 6 | 3,084 | | 14,071 | |
| | | | **107,967** | | **112,823** |
| **මුළු වත්කම්** | | | **2,531,466** | | **2,536,297** |
| | | | | | |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | 966,972 | | 966,972 | |
| නිකුත් කරන ලද ප්‍රාග්ධනය | | 9,997 | | 9,997 | |
| ප්‍රත්‍යාගණන සංචිත | | 536,119 | | 536,119 | |
| සමුච්චිත ලාභ/අලාභ | | 301,537 | | 372,864 | |
| | | | **1,814,625** | | **1,885,952** |
| **ප්‍රවර්තන නොවන වගකීම්** | | | | | |
| දිගු කාලීන ණය | 7 | 546,177 | | 492,426 | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 8 | 17,796 | | 18,919 | |
| | | | **563,973** | | **511,345** |
| **ප්‍රවර්තන වගකීම්** | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 9 | 124,791 | | 62,857 | |
| කෙටිකාලීන ණය | | 1,161 | | 53,665 | |
| පොලී ගෙවන ණය වල ජංගම කොටස | 10 | 26,916 | | 22,478 | |
| | | | **152,868** | | **139,000** |
| **මුළු යෙදවුම් හා වගකීම්** | | | **2,531,466** | | **2,536,297** |
| | | | | | |

සි.අයි.කරුණාතිලක
**ගණකාධිකාරී**

ජේ.කේ.එන්. පෙරේරා
**ක්‍රියාකාරී අධ්‍යක්ෂක**

එන්. එස්. එම්. සම්සුඩීන්
**සභාපති**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය

*රු '000*

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|
| ආදායම් | 11 | 361,933 | 656,071 |
| | | | |
| විකුණුම් පිරිවැය | 12 | (372,536) | (656,676) |
| | | | |
| **දළ ලාභය** | | **(10,603)** | **(605)** |
| | | | |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 13 | 33,330 | 35,623 |
| | | | |
| බෙදාහැරීමේ පිරිවැය | | (5,776) | - |
| | | | |
| පරිපාලන පිරිවැය | | (72,540) | (16,878) |
| | | | |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | | - | (3,995) |
| | | | |
| **මෙහෙයුම් වලින් ලාභය** | 14 | **(55,589)** | **14,145** |
| | | | |
| මූල්‍ය පිරිවැය | 15 | (14,749) | (11,545) |
| | | | |
| **බදු පෙර ලාභය** | | **(70,383)** | **2,600** |
| | | | |
| ආදායම් බදු වියදම | | - | - |
| | | | |
| **බදු පසු ලාභය** | | **(70,383)** | **2,600** |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

*රු '000*

| | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගනන සංචිත | සාමාන්‍ය සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| **2007 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **438,019** | **1,951,107** |
| මෙම වර්ෂයේ ලාභය (2008) | - | - | - | 8,498 | 8,498 |
| **2008 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **446,517** | **1,959,605** |
| මෙම වර්ෂයේ අලාභය (2009) | - | - | - | (79,373) | (79,373) |
| **2009 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **367,144** | **1,880,232** |
| මෙම වර්ෂයේ ලාභය (2010) | - | - | - | 5,074 | 5,074 |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **372,218** | **1,885,306** |
| මෙම වර්ෂයේ ලාභය (2011) | - | - | - | 2,600 | 2,600 |
| පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපීම | - | - | - | (1,954) | (1,954) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **372,864** | **1,885,952** |
| මෙම වර්ෂයේ අලාභය (2012) | - | - | - | (70,383) | (70,383) |
| පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපීම | - | - | - | (944) | (944) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **966,972** | **536,119** | **9,997** | **301,537** | **1,814,625** |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2012
## දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

*රු '000*

| | | දෙසැම්බර් 31 දිනට ශේෂය | | | |
|---|---|---|---|---|---|
| | | 2012 | | 2011 | |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය</u>** | | | | | |
| ශුද්ධ මෙහෙයුම් අලාභය | | | **(70,383)** | | **2,600** |
| මුදල් චලනයන් අන්තර්ගත නොවන අයිතමයන් සඳහා ගැලපීම් ලාභ/අලාභ | | | | | |
| ක්ෂය වීම් | | 3,339 | | 562 | |
| පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපීම | | (944) | | (1,954) | |
| සේවක ණය වලින් ලත් පොලී | | (260) | | (270) | |
| ඉඩම් බදු දීමෙන් ලැබුණු කුලී ආදායම | | (22,478) | | (22,714) | |
| තැන්පතු මත පොල | | (3,967) | | (2,419) | |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගැලපීම් | | 1,335 | | 1,385 | |
| | | | (22,975) | | (25,410) |
| **කාරක ප්‍රාග්ධනයට අදාල අයිතමයන් වෙනස්කම් වලට පෙර මෙහෙයවූ ලාභ/අලාභ** | | | **(93,358)** | | **(22,810)** |
| *කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්කම්* | | | | | |
| තොගය - වැඩිවීම/අඩුවීම | | 3,409 | | 8,157 | |
| ණයකරුවන් හා තැන්පතු (වැඩිවීම/අඩුවීම) | | (10,544) | | 42,102 | |
| පූර්වගෙවීම් (වැඩිවීම/අඩුවීම) | | 1,004 | | (659) | |
| ගෙවිය යුතු ගිණුම් (වැඩිවීම/අඩුවීම) | | 39,456 | | 12,207 | |
| | | | 33,325 | | 61,807 |
| | | | **(60,033)** | | **(38,997)** |
| අඩුකලා - ගෙවූ ආදායම් බදු | | - | | - | |
| ගෙවූ පාරිතෝෂික | | (2,458) | | (1,249) | |
| | | | (2,458) | | (1,249) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපයූ පාවිච්චි කළ ශුද්ධ මුදල** | | | **(62,491)** | | **37,748** |
| | | | | | |
| **<u>ආයෝජන ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ</u>** | | | | | |
| ස්ථාවර වත්කම් ලබා ගැනීම | | (30) | | (7,328) | |
| තැන්පතුවලින් ලත් පොලී | | 3,967 | | 2,419 | |
| සේවක ණය වලින් ලත් පොලී | | 260 | | 270 | |
| ඉඩම් බදු දීමෙන් ලැබුණු කුලී ආදායම | | 22,478 | | 22,714 | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | | (3,334) | | 42,597 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ශුද්ධ මුදල්** | | | **23,341** | | **60,672** |
| | | | | | |
| **<u>මූල්‍ය ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ ගෙවූ පොලිය</u>** | | | | | |
| කල් බදු වාරික ගෙවීම් | | (52,504) | | (94,110) | |
| පොලී ගෙවීම් | | 40,000 | | - | |
| ඉඩම් බදු දීමෙන් ඉදිරියට ලැබුණු කුලී ආදායම | | 13,751 | | - | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පාවිච්චි කල ශුද්ධ මුදල** | | | **1,247** | | **(94,110)** |
| | | | | | |
| ශුද්ධ මුදල් හා මුදල් සමකවල ශුද්ධ (අඩුවීම/වැඩිවීම) | | | (37,904) | | 4,310 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමක** | | | **14,072** | | **9,762** |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමක** | | | **(23,832)** | | **14,072** |

**සටහන :**මෙම මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 09ට අනුකූලව පිළියෙල කර ඇති අතර, වක්‍ර ක්‍රමයට ඉදිරිපත් කර ඇත.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

### 2012 දෙසැම්බර් 31 වන දිනට

### ගිණුම් පිළිබඳ සටහන්

**සටහන (1) ස්ථාවර වත්කම් ලේඛණය**

| **විස්තරය** | **2012.01.01 දිනට මුලික විටිනාකම** | **වර්ෂය තුලදී මිලදී ගැනීම්** | **වර්ෂය තුලදී අපහරණය** | **2012.12.31දිනට වටිනාකම** |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 538,003,481 | - | - | 538,003,481 |
| මෝටර්රථ | 18,490,035 | - | - | 18,490,035 |
| ගෘහ භාණ්ඩ,තිරවුරු හා සවි කිරිම් | 5,216,776 | 6,450 | - | 5,223,226 |
| උපකරණ හා චංචල ආම්පන්න | 1,073,323 | 23,550 | - | 1,096,873 |
| **එකතුව** | **562,783,615** | **30,000** | - | **562,813,615** |

| | | | | |
|---|---|---|---|---|
| **අඩු කළා : සමුච්චිත ක්ෂය** | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 207,421 | 20,742 | - | 228,163 |
| මෝටර්රථ | 7,573,462 | 2,766,090 | - | 10,339,552 |
| ගෘහ භාණ්ඩ,තිරවුරු හා සවි කිරිම් | 3,274,953 | 487,930 | - | 3,762,883 |
| උපකරණ හා චංචල ආම්පන්න | 1,022,462 | 64,641 | - | 1,087,103 |
| **එකතුව** | **12,078,298** | **3,339,403** | - | **15,417,701** |
| | | | | |
| **2012.12.31 දිනය ශුද්ධ වටිනාකම** | **550,705,317** | | | **547,395,914** |

ආයතනය සතු කොල්ලුපිටියෙහි පිහිටි ඉඩම ඇපයට තබා බැංකු ණය පහසුකම් ලබා ගෙන ඇත. 2008.02.25 දිනැති ලිපිය මඟින් අනුමත ණය සිමාව රු. 172,000,000 ක් වේ.

අක්කර 221 ක් වු පුත්තලම පලාවිහි පිහිටා ඇති කැලෑ බද ඉඩම නැවත තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලිමක් කර ඇති අතර, එය ඉටු වු වහාම අදාල ගිණුම් වලට ඇතුලත් කිරිමට කටයුතු කරනු ලැබේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2012 දෙසැම්බර් 31 වන දිනට

### ගිණුම් පිළිබඳ සටහන්

| 2011 | | 2012 |
|---|---|---|
| | **සටහන (2) දීර්ඝ කාලීනව ලැබිය යුතු රු.757,223,883/=** | |
| 424,169,977 | ලංකා සිමෙන්ති සමාගම බිහි කිරීමට කෙටිකාලීන සහ දිගු කාලීන ණය | 424,169,977 |
| 333,053,906 | කර්මාන්ත ශාලා දෙකම වැසීමට පෙර ලංකා සිමෙන්ති සමාගම සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර අභ්‍යන්තර ගනුදෙනු | 333,053,906 |
| **757,223,883** | | **757,223,883** |
| | | |
| | **සටහන (3) පාලිත සමාගම්වල හා වෙනත් ඒවායේ ආයෝජනය රු. 1,090,018,910/=** | |
| | ශේෂපත්‍ර දිනට ලංකා සිමෙන්ති සමාගමේ කොටසක වෙළඳපෙළ වටිනාකම රු.23.25 කි. 2011 වසරේදී කොටසක අගය ස්වල්ප වශයෙන් වැඩි වූ අතර එහි උපරිම අගය රු.34ක් විය. | |
| | | |
| | ***පාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම (පී.එල්.සී.)*** | |
| 1,083,618,910 | කොටසක් රු.10/= බැගින් කොටස් 108,361,891 ක 62.45% ක අයිතිය | 1,083,618,910 |
| | ***ලෆාර්ජ් සිමෙන්ති සමාගම*** | |
| 6,400,000 | කොටසක් රු.15/= බැගින් කොටස් 320,000 සහ කොටස් 160,000 (1995 ප්‍රසාද නිකුතුව) | 6,400,000 |
| **1,090,018,910** | | **1,090,018,910** |
| | | |
| | **සටහන (4) භාණ්ඩ ලැයිස්තුව - රු. 17,123,489/-** | |
| | | |
| 5,349,307 | කොන්ක්‍රීට් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින වැඩ | 3,856,289 |
| 9,424,700 | කොන්ක්‍රීට් කණු ඇතුලු නිමි භාණ්ඩ තොගය | 10,051,000 |
| 37,741 | සිමෙන්ති තොගය | 3,216,200 |
| **14,811,748** | | **17,123,489** |
| | | |
| | **සටහන (5) - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ -රු.87,515,956/-** | |
| 65,401,957 | ප්‍රධාන කාර්යාලය | 60,439,022 |
| 11,569,564 | කන්කසන්තුරේ සිමෙන්ති කම්හල (යාපනය කාර්යාලය) | 21,357,157 |
| 5,719,777 | කන්කේසන් සිමෙන්ති කම්හලට 1990 මිලදී ගත් හා පුත්තලම සිමෙන්ති කම්හලේ ගබඩා කර ඇති අමතර කොටස් තොගය | 5,719,777 |
| **82,691,298** | | **87,515,956** |
| | | |
| | **සටහන (6) - මුදල් හා මුදල් සමාන දෑ - රු.3,084,430/-** | |
| 278,454 | මහජන බැංකුව - ජාත්‍යන්තර ශාඛාව | 253,954 |
| - | මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා | 1,109,822 |
| 22,046 | මහජන බැංකුව - වව්නියා ශාඛාව | 22,046 |
| - | මහජන බැංකුව - යාපනය | - |
| 11,388,824 | ලංකා බැංකුව, කෝපරේට් | - |
| 2,346,995 | ලංකා බැංකුව, ලේක්වීව් ශාඛාව | 1,663,811 |
| 34,797 | කොමර්ෂල් බැංකුව, යුනියන් ප්ලේස්/යාපනය | 34,797 |
| **14,071,116** | | **3,084,430** |
| | | |
| | **සටහන (7) -ප්‍රවර්තන නොවන වගකීම් - රු:546,177,204/-** | |
| 492,426,190 | මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 492,426,190 |
| - | ප්‍රධාන කාර්යාලය ගෙවිය යුතු | 53,258,311 |
| - | කන්කසන්තුරේ සිමෙන්ති කම්හල (යාපනය ශාඛාව) | 492,703 |
| **492,426,190** | | **546,177,204** |
| | -සි/ස හොලිම් ලංකා ආයතනයට කල්බදු ක්‍රමයට ලබා දි ඇති පුත්තලම අරුවක්කාලුහි පිහිටා ඇති ඉඩම වෙනුන් ලැබිය යුතු කල්බදු වාරික ඇපයට තබා<br>අයිටාල්ට්‍රේඩ්ඉන්ටර්නැෂනල්ආයතනයවෙතගෙවීමටනියමවූඇමරිකානුඩොලර් 300,000/-<br>කමුදලභාණ්ඩාගාරයේනියමයන්ටඅනුකූලවගෙවාපියවාදැමීමටලංකාබැංකුවෙන්ණය මුදලක්ලබාගන්නා ලදි. | |

| 2011 | | 2012 |
|---|---|---|
| | **සටහන (8) - පාරිතෝෂික සඳහා වෙන් කිරීම පහත පරිදි වේ.** | |
| 18,783,093 | විශ්‍රාමික පාරිතොෂික සඳහා වෙන්කිරීම් වල ආරම්භක ශේෂය | 18,918,853 |
| (1,249,433) | වර්ෂයේදී ඉවත්ව ගිය සේවකයන් සඳහා කල ගෙවීම් | (2,457,018) |
| 17,533,660 | වර්ෂය අවසන් දිනට පවතින වෙන් කිරීම් ශේෂය | 16,461,835 |
| 1,385,193 | වසරට අදාල වෙන් කිරීම් | 1,334,555 |
| **18,918,853** | වර්ෂය අවසනදිනට සේවකයින් 64 දෙනෙකු සඳහා හිමි වෙන් කිරීම් | **17,796,390** |
| | | |
| | විශ්‍රාම පාරිතෝෂික සඳහා ඇති ප්‍රතිපාදන මුදල් මහා භාණ්ඩාගාර බිල්පත් වල තැන්පත් කර ඇත. | |
| | | |
| | **සටහන (9) - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු රු.124,791,482/-** | |
| 68,547,555 | ප්‍රධාන කාර්යාලය ගෙවිය යුතු | 114,103,084 |
| 16,785,357 | කන්කසන්තුරේ සිමෙන්ති කම්හල (යාපනය ශාඛාව) | 10,688,398 |
| **85,332,912** | | **124,791,482** |
| | **සටහන (10) -මුදල් හා මුදල් සමාන දෑ - රු.** | |
| - | මහජන බැංකුව - යාපනය | 792,813 |
| - | ලංකා බැංකුව, කෝපරේට් | 26,123,381 |
| | | **26,916,194** |
| | **සටහන (11) ආදායම - රු.** | |
| 649,210,889 | සිමෙන්ති විකුණුම් - කොළඹ | 336,315,047 |
| 6,860,513 | කොන්ක්‍රීට් නිෂ්පාදන විකුණුම්- යාපනය | 25,618,350 |
| **656,071,402** | | **361,933,397** |
| | **සටහන (12) - විකුණුම් පිරිවැය - රු.** | |
| 644,387,464 | සිමෙන්ති විකුණුම් පිරිවැය - කොළඹ | 343,472,460 |
| 12,288,400 | කොන්ක්‍රීට් නිපැයුම්හි නිෂ්පාදන පිරිවැය වන සෘජු කාර්යමණ්ඩල පිරිවැයද ඇතුලත් කර ඇත. | 29,063,586 |
| **656,675,864** | | **372,536,046** |
| | **සටහන (13) - වෙනත් මෙහෙයුම් ආදායම් - රු.33,330,465/-** | |
| | | |
| 22,713,936 | ඉඩම් බදු දීම | 22,478,228 |
| 2,418,587 | තැන්පතු මත පොලී | 3,967,011 |
| 270,346 | සේවක ණයට අදාල පොලී | 259,660 |
| 756,697 | විවිධ | 861,735 |
| 3,500,000 | ලිහිසිතෙල් | (200,000) |
| 5,963,831 | මිල් පවර් ව්‍යාපෘතියට කුලියට දීම | 5,963,831 |
| **35,623,397** | | **33,330,465** |
| | | |
| | **සටහන (13) - බදු පෙර අලාභය රු. 70,382,929/-** | |
| | බදු පෙර ලාභය පහත දැක්වෙන වියදම් අඩු කල පසු වේ. | |
| | | |
| | කාර්යමණ්ඩල වැටුප් ප්‍රතිලාභ | 16,688,428 |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා | 369,000 |
| | පාරිතෝෂික ප්‍රතිපාදන | 1,334,556 |
| | විගණන ගාස්තු ප්‍රතිපාදන | 120,000 |
| | වාහන නඩත්තු හා ධාවන වියදම් | 2,925,127 |
| | ක්ෂය | 3,339,403 |
| | තොග හානි | 9,100,000 |
| | | |
| | | |
| | **සටහන (13) - මූල්‍ය පිරිවැය රු. 14,794,215/-** | |
| | | |
| 3,693,058 | බැංකු අයිරාපොලී | 3,394,384 |
| 7,851,487 | ණයපොලී | 11,399,831 |
| **11,544,545** | | **14,794,215** |
| | | |

සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් පකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2013 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලදී.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේවුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයාගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමටමට නොහැකි විය.

**1.4** මතය ව්‍යාවනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතයවාාචනය

මෙම වාර්තාවේ 2.2.6 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳවම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස්වලින් සියයට 62.45ක් සංස්ථාව සතුව පැවතියද උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකු අයිරා පහසුකම් ලබාගැනීම පිණිස කොල්ලුපිටිය පිහිටි ඉඩම සහ පෞද්ගලික සමාගමකට හුණුගල් නිධිය බදු දීමෙන් ලැබෙන ආදායම ඇපයට තබා බැංකුවකින් රු.26,916,193ක බැංකු අයිරාවක් සහ රු.40,000,000ක ණය මුදලක් ලබාගෙන තිබුණද, එය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්ෂය කර අවසන් වූ එහෙත් දැනුදු භාවිතයේ පවතින පිරිවැය රු.5,096,661ක් වූ ගොඩනැගිලි, ගෘහභාණ්ඩ හා මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුත්තලම සිමෙන්ති කම්හලේ ගාල් කර තිබුණු 1990 වර්ෂයේදී මිලදීගන්නා ලද සංස්ථාවට අයත් රු.5,719,771ක් වූ ට්‍රැක්ටර් 02ක්, ට්‍රේලර් 03ක්, මෝටර් සයිකල් 04ක් හා අමතර කොටස් තොගය මූල්‍යප්‍රකාශන වල තොග ලෙස දක්වා තිබුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යාපනය ශාඛාවේ ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශනයේ ඊට අදාල ශේෂ අතර රු.5,424,828 ක වෙනස්කම් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය රු.114,103,084 ක් වූ අතර, කාල විශ්ලේෂණය අනුව එය රු.113,031,656ක් වූයෙන්වෙනස රු.1,071,428ක්විය.

**2.2.5** ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් ශේෂය රු.839,200,063ක් විය. ඉන් රු.13,435,491 ක් වසර 2කට වඩා පැරණි ශේෂ වූ අතර , රු.35,307,781 ක් වසර 03 වඩා පැරණි ණය ශේෂ විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය රු. 616,960,673 ක් විය. ඉන් රු.5,286,079 ක් වසර 2කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.22,526,199 ක් වසර 03ට වඩා පැරණි ණය ශේෂ විය.

**2.2.6** විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | දේපළ පිරියත හා උපකරණ | 547,395,912 | ස්ථාවර වත්කම් ලේඛණය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, හිමිකම් ඔප්පු |
| (ආ) | තොගය | 22,843,266 | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ඇ) | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ | 81,796,180 | |
| (ඈ) | වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 124,791,483 | |
| (ඉ) | බැංකු අයිරාව | 26,916,194 | |
| (ඊ) | ජංගම නොවන බැරකම් | 563,973,594 | ශේෂ සනාථ කිරීම් හා කාල |
| (උ) | ජංගම බැරකම් | 125,952,196 | |
| (ඌ) | දිගු කාලීන ණය (ලංකා සිමෙන්ති සමාගම) | 757,223,883 | විශ්ලේෂණ |
| (එ) | බැංකු ශේෂය | 3,084,430 | ශේෂසනාථ කිරීම |

**2.2.7 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

විගණනයේදී පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූලනොවීම |
|---|---|---|
| (අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 2 වගන්තිය | | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.6,850,515 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) 2002 අංක14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2.1 වගන්තිය | (i) | සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.4,752,790 ක් වූ එකතු කළ අගය මත වූ නිමැවුම් බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| | (ii) | රු.6,431,738 ක වූ ලැබිය යුතු එකතු කළ අගය මත යෙදවුම් බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙතින් හිලවු කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1990 අංක 6 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 3 වගන්තිය | | බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු ඉකුත් වර්ෂවලට අදාලරු.7,101,932 ක් වූ ව්‍යාපාර පිරිවැටුම් බදු ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) මු.රෙ.756 | | මුදල් වර්ෂය අවසන් වූ වහාම සෑම වත්කමක් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා වාර්තා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/2002/02 දරන භාණ්ඩාගාරචක්‍රලේඛය | | චක්‍රලේඛය ප්‍රකාර පරිගණක, පරිගණක උපාංග හාමෘදුකාංග සඳහා වත්කම් ලේඛනයක් නඩත්තු කරනොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍යප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව,සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් සංස්ථාව රු.70,382,929 ක ඌණතාවයක් ලබා තිබූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,600,231 ක් වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ රු.72,983,160 ක හෙවත් සියයට 2,807ක පිරිහීමක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.72,983,160 ක පිරිහීම කෙරෙහි පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේදී ජාත්‍යන්තර ආයතනයකට ගෙවන ලද රු.38,704,668 ක් වූ වන්දි මුදල හා රු.3,458,588 ක් වූ මූල්‍ය පිරිවැය

(ආ) පසුගිය වර්ෂයේ විකුණුම් හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.294,138,005 කින් හෙවත් සියයට 45 කින් අඩුවීතිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුළු විකුණුම් රු.361,933,397 ක් වූ අතර ඊට අදාල විකුණුම් පිරිවැය රු.383,935,878 ක් වූයෙන් දළ අලාභය රු.22,002,481 ක් වීතිබීම.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කන්කසන්තුරේ සිමෙන්ති කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු ආදායමට වඩා වියදම් දැරීමට සිදුවීම නිසා දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර පසුගිය වසර පහ සහ සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ අලාභයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ආදායම | වියදම | අලාභය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2007 | 1.54 | 21.06 | (19.52) |
| 2008 | 17.92 | 24.78 | (6.86) |
| 2009 | 36.89 | 43.99 | (7.10) |
| 2010 | 27.33 | 27.36 | (0.03) |
| 2011 | 6.86 | 16.28 | (9.42) |
| 2012 | 32.46 | 38.12 | (5.66) |

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව,සමාලෝචිත වර්ෂය තුළදී සිමෙන්තිමෙට්‍රික් ටොන් 121,000 ක් අලෙවි කිරීමටත් එමගින් රු.1,597,200,000 ක් ආදායමක් ඉපයීමටත් ඉලක්ක කර තිබුණි.කෙසේ නමුත්,තථ්‍ය විකුණුම් රු.361,933,397 ක් වුයෙන්මුළු අපේක්ෂිත විකුණුම්වලින් ලහාකර ගෙන තිබුණේසියයට 23 ක් පමණි. කිසිදු මාසයක අපේක්ෂිත විකුණුම් ඉලක්ක කරා ලඟාවීමට සංස්ථාව අපොහොසත වී තිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක විය.

(ඇ) සංස්ථාවේ කාර්ය සාධනය ඉහල නැංවීම පිණිස 2012 වර්ෂයේදි මසකට සිමෙන්ති කනේටනර් 400 ක් ආනයනය කිරීමටත්, කොල්ලුපිටියේ ඇති ඉඩමෙහි නව ගොඩනැගිල්ලක්ඉදිකිරීමටත්, කන්කසන්තුරේ කම්හලෙන් සිමෙන්ති කණු නිෂ්පාදනය වර්ෂයකට කණු 3000 දක්වා ඉහල නැංවීමටත්, කන්කසන්තුරෙහි නව සිමෙන්ති ඇසුරුම් කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමටත් සැලසුම් කර තිබුණද, එම ඉලක්ක කිසිවක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉටුකරගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4.2 <u>කළමණාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් අක්කර 5,352 ක් වූ අරුවක්කාලු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදි සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් හාරා ගැනීමට පෞද්ගලික සිමෙන්ති නිෂ්පාදන සමාගමකට වසර 50 ක කාල සීමාවකට බදු දී තිබුණි. ගිවිසුම අනුව, අයකරගත යුතු කුලිය වර්ෂයකට රු.22,478,228 ක් විය. කෙසේ නමුත්, ඇති කරගෙන තිබූ බදු ගිවිසුමේ කොන්දේසි අනුව වසර 50 තුළම කුලී සංශෝධනයන් කිරීමේ හැකියාවක් සංස්ථාවට හිමිවී නොතිබුණි. මෙම තත්ත්වය 2011 අගෝස්තු 16 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවධානය යොමුකර හුණුගල් නිධිය පිළිබඳ වූ බදු ගිවිසුම නැවත සංශෝධනය කිරීමට උපදෙස් ලබාදුන් නමුත් 2013 අගෝස්තු 31 දින වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාව සතුව පුත්තලම පාලවී හා කල්ලඩි ප්‍රදේශවල තිබූ අක්කර 150 ක පමණ වූ ඉඩම් ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි.මින් අක්කර 09 ක් වූ ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් නිවාස ඉදිකර පදිංචි වී තිබුණි. අනාරක්ෂිත වහා ප්‍රයෝජනයකින් තොරව මෙම ඉඩම් වල් බිහිවී පැවතීම නිසා අනවසර පදිංචිවීම වැලැක්විය නොහැකිවී තිබුණි.

(ඇ) 2003 වර්ෂයේ ණය පදනම මත ලබා දී තිබූ සිමෙන්ති මළු 5100 ක් සඳහා විකුණුම් නියෝජිත වරයකු ලබාදී තිබූ රු.1,656,000 ක් වූ චෙක්පත් අගරු වී තිබුණි. එම මුදල නෛතික පොලියද සමග අයකර ගැනීම සඳහා 2008 පෙබරවාරි 11 දින නඩු පවරා තිබුණි. නඩු තීන්දු ප්‍රකාර නියෝජිතගේ භාණ්ඩ හා දේපල අධිකරණ තහනමට ගන්නා ලද නමුත්එම දේපල වෙන්දේසි කර හෝ සංස්ථාවට වසර 10ක සිට හිඟ හිට පවතින මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරයන් ප්‍රදානය කිරීමේදී ණයට ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැදුම්කරයක් ලබා නොගැනීම, ණය විය හැකි උපරිම සීමා ගිවිසුමේ සඳහන් නොකිරීම, ණය ගෙවීම පැහැර හරින්නන්ගෙන් ණය අයකර ගන්නා ක්‍රමවේදය ගිවිසුමට ඇතුළත් නොකිරීම, ණය ගෙවීමට අපොහොසත්ව තිබියදී නැවත නැවතත්ණයට සැපයීම, බැංකු ඇපකර සඳහා ව්‍යාජ තොරතුරු ලබාදීම , අවිධිමත් පරිදි ණය අනුමත කරන ලද නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනීම හා අයවිය යුතු ණය ශේෂ පිළිබඳ පසු විපරම් නොකිරීම වැනි කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගත නොහැකිව තිබූ මුළු ණය ශේෂය රු.**44,467,236** ක් වූ අතර, ඉන්රු. **3,832,137** වසර **09** ක් ඉක්මි වූ පැරණි ණය ශේෂවිය.

**4.3** ආර්ථික නොවන ගනුදෙනු
---------------------------------------------------------------

සංස්ථාව විසින් රු.**1,088,418,910** ක මුදලක් පෞද්ගලික සමාගම් දෙකක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාවට ලැබී නොතිබිණි.

**4.4** අන්තර් ජාතික සමාගමකට වන්දි ගෙවීම **–එ.ජ.ඩො. 300,000**
---------------------------------------------------------------

1990 වර්ෂයේදී සිමෙන්ති නිෂපාදනයට අවශ්‍ය අමුද්‍රව්‍යක් වන ක්ලින්කර් ආනයනය සඳහා සංස්ථාව විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ස්ථාපිත අනතර්ජාතික සමාගමක් සමග ගිවිසුම් දෙකකට එළැඹී තිබුණි. එකී ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර සමාගම විසින් එ.ජ.ඩොලර් **475,000** ක නාම මාත්‍ර බැඳුම්කරයක් ලබා දී තිබූ අතර, සංස්ථාව විසින් දේශීය බැංකුවක් හරහා ක්ලින්කර් ආනයනයට අවශ්‍ය ණයවර ලිපිය විවෘත කර තිබුණි.

ගිවිසුම් ප්‍රකාර අවශ්‍ය ක්ලින්කර් සැපයීමට අදාල සමාගම අපොහොසත් වී තිබුණෙන් ඔවුන්ගේ ඉල්ලීම මත සංස්ථාව විසින් ණයවර ලිපි වල කාලය දෙවරක් දීර්ඝකර තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාවේ උන්නතිය හා සිමෙන්ති නිෂපාදනය අඩු වීමෙන් සිදුවිය හැකි පාඩුව අවම කර ගැනීම සඳහා එවැනි ඉල්ලීම් සඳහා තවදුරටත් ඉඩ නොදීම මත හා නිසි පරිදි ක්ලින්කර් සැපයීමසිදු නොකිරීම මත නාම මාත්‍ර බැඳුම්කරය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කිරීමත් සමග සංස්ථාව හා අදාල සමාගම අතර මතභේදයක් හට ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවයම යම් යම් ක්‍රියා මාර්ග ගෙන තිබුණද අවසන් ක්‍රියා මාර්ගයකට එළඹීමට අපොහොසත් වී තිබුණි.

මේ පිළිබඳව එවකට සංස්ථාවට අයත් රේඛීය අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව එක්ව දෙපාර්ශවයේම එකඟතාවය ඇතිව **2002** වර්ෂයේදී ලෝකබැංකුවේ බහුපාර්ශවික අන්තර්ජාතික සහතිකවීමේ නියෝජිත ආයතනයේ මැදිහත් වීම මත සංස්ථාව සහ පෞද්ගලික කරන ලද පුත්තලම සිමෙන්ති සමාගම එක්ව ඉහත සමාගමට එ.ජ.ඩො. මිලියන **1.3** ක වන්දියක් ගෙවීමට අවසන් එකඟතාවයට පැමිණ තිබුණි. ඒ අනුව පෞද්ගලික සමාගම විසින් එ.ජ.ඩො. මිලියනයක ගෙවා තිබුණු අතර සංස්ථාව විසින් ගෙවිය යුතු හිඟ මුදල අරමුදල් දුෂ්කරතා හේතුවෙන් ගෙවීම ප්‍රමාද කර තිබුණි.

කෙසේ නමුත්, අන්තර්ජාතිකව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ආරක්ෂාකර ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත වන්දි මුදල් ගෙවීමට **2012** නොවැම්බර් **01** දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඉහත සමාගමට ගෙවිය යුතු එ.ජ.ඩො.**300,000** ට සමාන රු.**38,704,668** ක මුදලක් බැංකු ණය පහසුකම් උපයෝගී කරගනිමින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

**4.5 හඳුනාගත් පාඩු**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිභෝගික සේවා අධිකාරිය විසින් කරන ලද වැටලීමකින් ගල්වූ සිමෙන්ති මළු **6,036** ක් බීසීසී ගබඩාවේද, මළු **8,295** ක් පෑලියගොඩ ගබඩාවේද තිබී හමුවී මුද්‍රා තබා තිබුණි. එම ගල් වූ සිමෙන්ති වලින් සංස්ථාවට රු.**9,100,000** ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) නිසි මූල්‍ය කළමනාකරණයක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබූ බැංකු අයිරා වෙනුවෙන් රු.**3,395,384** ක බැංකු අයිරා පොලී ගෙවා තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිමෙන්ති මෙට්‍රික් ටොන් **28,249** ක් හෙවත් සිමෙන්ති මළු **576,156** ක් ආනයනය කර තිබුණි. ඉන් මළු **221** ක් අස්ථානගත වී තිබුණි. අස්ථානගත වූ මළුවල වටිනාකම රු.**163,578** ක් විය.

**4.6 ඌණ උපයෝජිත වත්කම්**

----------------------------

සංස්ථාව විසින් රු. **550,000** ක මුදලක් වැයකර කන්වේයර් යන්ත්‍රයක් **2011** වර්ෂයේදී මිලදී ගෙන තිබූ අතර, ඊට අවශ්‍ය අමතර උපාංග සඳහා රු.**27,429** ක් වැයකර තිබුණි. මිලදී ගත් දින සිටම මෙම යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව තබා තිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සම්පත්**

----------------------------------------------------

රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොගත යුතු නමුත් ඊට පටහැනිවසංස්ථාව විසින් රු. **4,800,000** කට මිලදී ගත් කැබ් රථයක් රේඛීය අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා යොදවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව අදාල වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, **2012** වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස **05** ක ප්‍රමාදයකින් පසු **2013** අගෝස්තු **15** දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

--------------------

**2011- 2015** වර්ෂ පහ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි සඳහන් මෙහෙවර , දැක්ම හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.කෙසේ වෙතත්,කලකට ඉහත දී දිවයිනේ එකම ප්‍රමුඛතම සිමෙන්ති නිෂ්පාදකයා හා අළෙවිකරුව සිටි සංස්ථාව අද වන විට සිමෙන්ති නිෂ්පාදනය මුළුමනින්ම නවතා දමා සිමෙන්ති ආනයනය කිරීමට පමණක් සීමා වී තිබුණි. සංයුක්ත සැලැස්ම සහ කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව එසේ කටයුතු කර නොතිබණි.

**5.3** ප්‍රසම්පාදන සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් 2012 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4** කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ 2012 වර්ෂයට අදාල කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 07 | 08 | - | 01 |
| විධායක නොවන | 24 | 16 | 08 | - |
| වෙනත් | 45 | 38 | 07 | - |
| | 76 | 62 | 15 | 01 |

අනුමත නොමැති විධායක ශ්‍රේණියේ එක් තනතුරක අතිරික්තයක් පැවතීම ගැටළුකාරී වුවත්, විධායක නොවන මට්ටමේ පුරප්පාඩු 08 ක් සමඟ වෙනත් පුරප්පාඩු 07 ක් පැවතීම සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට අභියෝගයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම තනතුරු පුරවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

**5.5** අයවැය පාලනය

අයවැය ගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**6.** පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ණය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ගබඩා පාලනය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම — **අධ්‍යක්ෂ මණ්ඩලයේ**අදහස් දැක්වීම

**2.2.1** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

---

(අ) සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45ක් සංස්ථාව සතුව පැවතියද උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි .

(අ) ඒකාබද්ධ ගිණුම් පිළයෙල කරමින් පවතින අතර පිළියෙල කර අවසන් වූ විගස විගණකාධිපතිතුමාට බාරදීමට කටයුතු සලස්වමි.

**2.2.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

(අ) බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම පිණිස කොල්ලුපිටිය පිහිටි ඉඩම සහ හුණුගල් නිධිය පෞද්ගලික සමාගමකට බදු දීමෙන් ලැබෙන ආදායම ඇපයට තබා බැංකුවකින් රු. 26,916,193ක බැංකු අයිරාවක් සහ රු. 40,000,000ක ණය මුදලක් ලබාගෙන තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි .

(අ) ඉදිරියේදී සියළුම කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු සලස්වමි.

**2.2.3** ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ක්ෂය කර අවසන් වූ එහෙත් දැනුදු භාවිතයේ පවතින පිරිවැය රු. 5,096,661ක් වූ ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ හා මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි .

(අ) දැනට ප්‍රත්‍යාගණනය කෙරෙමින් පවතින අතර එය නිම වූ වහාම මෙම වසරේ සිට ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) පුත්තලම සිමෙන්ති කම්හලේ ගාල් කර තිබුණු 1990 වර්ෂයේදී මිලදී ගන්නා ලද සංස්ථාවට අයත් රු. 5,719,771 ක් වූ ට්‍රැක්ටර් 02ක්, ට්‍රේලර් 03ක්, මෝටර්සයිකල් 04 ක් හා අමතර කොටස් තොගය මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස දක්වා තිබුණි .

(ආ) පුත්තලම සිමෙන්ති කම්හලේ ගාල්කර ඇති මෙම අයිතමයන් මේ වසරේ තොග ගිණුමෙන් ඉවත් කිරීමට පියවර ගනිමු.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | |
|---|---|
| (අ) යාපනය ශාඛාවේ ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශනයේ ඊට අදාල ශේෂ අතර රු. 5,424,828ක වෙනස්කම් පැවතුණි. | 2012.01.01 දිනට වූ ශේෂය නිවැරදි නොවූ හෙයින් මූල්‍යප්‍රකාශනවල පිළියෙල කිරීමේදී එම වරද නිවැරදි කරන ලදී. |
| (අ) යාපනය ශාඛාවේ ශේෂ පිරික්සුම තුළ වූ සමුච්චිත ලාභ/අලාභ ගිණුමෙහි | |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය රු. 114,103,084 ක් වූ අතර, කාල විශ්ලේෂණය අනුව එය රු. 113,031,656ක් වූයෙන් වෙනස රු. 1,071,428ක් විය. | (ආ) මෙවැනි වැරදි මෙම වසරේ සිට සිදුනොවීමට වග බලා ගනිමු. |

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | |
|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් ශේෂය රු. 839,200,063ක් විය. ඉන් රු. 13,435,491ක් වසර 2 කට වඩා පැරණි ශේෂ වූ අතර, රු. 35,307,781ක් වසර 03 වඩා පැරණි ණය ශේෂ විය. | (අ) පැරණි ශේෂයන් අයකර ගැනීමට කටයුතු සලස්වමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය රු. 616,960,673 ක් විය. ඉන් රු. 5,286,079ක් වසර 2කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු. 22,526,199ක් වසර 03ට වඩා පැරණි ණය ශේෂ විය. | (ආ) පැරණි ණය ශේෂයන් සංස්ථාවේ මූල්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ගෙවා පියවා දැමීමට කටයුතු සලස්වමි. |

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) දේපළ පිරියත හා උපකරණ (547,395,912) ස්ථාවරවත්කම් ලේඛණය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, හිමිකම්ඔප්පු

(අ)සහ(ආ)ඉදිරියේදී වත්කම් සහභාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපතිතුමා වෙත එවීමට කටයුතු සලස්වමි.

(ආ) තොගය 22,843,266
භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා

### 2.2.7 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණතීරණවලට අනුකූලනොවීම

විගණනයේදීපහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) **2009** අංක **09** දරන ජාතිය ගොඩනැගීමේ බදුපනතේ **2** වගන්තිය
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.**6,850,515** ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ)දැනට ආයතනය තුළ පවතින අයහපත් මූල්‍යතත්වය හේතුවෙන් ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම්කොමසාරිස්වෙත ප්‍රේෂණයකළ නොහැකි වී ඇති අතර ඉදිරියේදී ගෙවීම් සිදුකිරීමට කටයුතු කරමු.

(ආ) **2002** අංක **14** දරන එකතු කළ අගය මත බදුපනතේ **2.1** වගන්තිය

(i) සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.**4,752,790**ක් වූ එකතු කළ අගය මත වූ නිමැවුම් බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) රු.**6,431,738**ක වූ ලැබිය යුතු එකතු කළ අගය මත යෙදවුම් බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙතින් හිලවු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) (i) , (ii) එකතු කළ අගය මත බදු ගෙවීමේදී දේශීය ආදායම් කොමසාරිස් වෙතින් අය විය යුතු වන එකතු කළ අගය මතබදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට අනුව හිලව් කළ යුතු පමාණය හිලවු කර දී ඇති අතර තවදුරටත් ගෙවිය යුතු වන බදු මුදල් ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන්නෙමු.

(ඇ) **1990** අංක **6** දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ **3** වගන්තිය

බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළයුතු ඉකුත් වර්ෂ වලට අදාල රු.**7,101,932** ක් වූ ව්‍යාපාර පිරිවැටුම් බදු ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) ආයතනය තුළ යහපත් මූල්‍ය තත්වයක් ඇති කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී මෙම ගෙවියයුතු ව්‍යාපාර පිරිවැටුම් බදු ගෙවීමට කටයුතු කරමු.

(ඈ) මු.රෙ.**756**

මුදල් වර්ෂය අවසන් වූ වහාම සෑම වත්කමක් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා වාර්තා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉදිරියේදී වත්කම් සමීක්ෂණ වාර්තා විගණකාධිපතිතුමා වෙත එවීමට කටයුතු සලස්වමි.

(ඉ) **2002** නොවැම්බර් **28** දිනැති අංක අයි ඒ අයි/**2002**/**02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

චක්‍රලේඛය ප්‍රකාර පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඉ) පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පිළියෙල කරමින් පවතින අතර එයපිළියෙල කල වහාම විගණකාධිපතිතුමා වෙත එවීමට කටයුතු සලස්වමි.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව,සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් සංස්ථාව රු.**70,382,929** ක ඌණතාවයක් ලබා තිබූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**2,600,231** ක් වී තිබුණි.ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ රු.**72,983,160** ක හෙවත් සියයට **2,807**ක පිරිහීමක් වී තිබුණි.

3.1 සමාලෝචිත වසරේ සිදුවූ රු. මිලියන **9**කට ආසන්න සිමෙන්ති ගල් වීමේ අලාභය මේ වසරේ මෙහෙයුම් ප්‍රතිඵලයේ පිරිහීමට සෘජුවම බලපාන ලදී.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.**72,983,160** ක පිරිහීම කෙරෙහි පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේදී ජාත්‍යන්තර ආයතනයකට ගෙවන ලද රු.**38,704,668** ක් වූ වන්දි මුදල හා රු.**3,458,588** ක් වූ මූල්‍ය පිරිවැය.

(ආ) පසුගිය වර්ෂයේ විකුණුම් හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායමරු.**294,138,005** කින් හෙවත් සියයට **45** කින් අඩු වී තිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුළු විකුණුම් රු.**361,933,397** ක් වූ අතර ඊට අදාල විකුණුම් පිරිවැය රු.**383,935,878** ක් වූයෙන් දළ අලාභය රු.**22,002,481** ක් වී තිබීම.

(අ).(ආ) අයිටාල් **ට්‍රේඩ්** ඉන්ටර්නැෂනල් ආයතනය වෙත ගෙවීමට නියම වූ ඇමරිකානු ඩොලර් 300,000/- ක මුදල භාණ්ඩාගාරයේ නියමයන්ට අනුකූලව ගෙවා පියවා දමන ලදී. සමාලෝචිත වසරේ මෙහෙයුම් අලාභය වැඩිවීමට මෙම කාරණාවද සෘජුවම බලපාන ලදී.

(ඇ) ටෙන්ඩර් මඟින් කොන්ක්‍රීට් නිපැයුම් සඳහා ඇණවුම් ලබා ගනිමින් නිෂ්පාදනය වැඩි කර මෙම අංශයේ අලාභය අවම කිරීමට පියවර ගනු ලැබේ. ඉදිරියේදීමෙමඉලක්කසාක්ෂාත්කරගැනීම බලාපොරොත්තු වේ.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනුලැබේ.

(අ) කත්කසන්තුරේ සිමෙන්ති කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු ආදායමට වඩා වියදම් ඇරිමට සිදුවීම නිසා දිගින් දිගටම පසුගිය වසරපහසහසමාලෝචිතවර්ෂයේලබා දී අලාභ ලබා තිබේ.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සිමෙන්තිමෙට්‍රික් ටොන් **121,000**ක්අලෙවිකිරීමටත්එමගින්රු.**1,597,200,000**ක්ආදායමක්ඉපයීමටත්ඉලක්ක කර තිබුණි. කෙසේනමුත්, තථ්‍ය විකුණුම් රු.**361,933,397** ක්වුයෙන්මුළු අපේක්ෂිත විකුණුම්වලින් ලබාකර ගෙන තිබුණේසියයට**23** ක් පමණි. කිසිදු මාසයක අපේක්ෂිත විකුණුම් ඉලක්ක කරා ළඟාවීමටසංස්ථාවඅපොහොසතවීතිබුණි. එහෙයින්සමාලෝචිත වර්ෂයේ ප්‍රගතියඉතාදුර්වලමට්ටමකවිය.

(අ).(ආ) මෙම වසරේ දී ලඟා කර ගත හැකි ඉලක්ක සහිත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමටත් එහි පවතින ඉලක්කයන් කරා ළඟාවීමටත් කටයුතු සලස්වූ ලැබේ.

(ඇ) සංස්ථාවේ කාර්ය සාධනය ඉහල නැංවීම පිණිස 2012 වර්ෂයේදි මසකට සිමෙන්ති කනේටිනර් 400 ක් ආනයනය කිරීමටත්, කොල්ලුපිටියේ ඇති ඉඩමෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමටත්, කන්කසන්තුරේ කම්හලෙන් සිමෙන්ති කණු නිෂ්පාදනය වර්ෂයකට කණු 3000 දක්වා ඉහල නැංවීමටත්, කන්කසන්තුරෙහි නව සිමෙන්ති ඇසුරුම් කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමටත් සැලසුම් කර තිබුණද, එමඉලක්ක කිසිවක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටුකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) කොල්ලුපිටියේ ඇති ඉඩම දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ බදු දීමටත් සහ කන්කසන්තුරේ කර්මාන්තශාලාවේ සිමෙන්ති ඇසුරුම් කර්මාන්තශාලාවක ආරම්භ කිරීමත් යන කරුණු දෙක කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නැති අතර සිමෙන්ති කණු නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා 2013 වසරේ කටයුතු සලස්වමි.

## 4.2 <u>කළමණාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් අක්කර 5,352 ක් වූ අරුවක්කාළු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදි සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් හාරා ගැනීමට පෞද්ගලික සිමෙන්ති නිෂ්පාදන සමාගමකට වසර 50 ක කාලසීමාවකට බදු දී තිබුණි. ගිවිසුම අනුව, අයකර ගත යුතු කුලිය වර්ෂයකට රු.22,478,228ක් විය. කෙසේ නමුත්, ඇති කරගෙන තිබූ බදු ගිවිසුමේ කොන්දේසි අනුව වසර 50 තුළම කුලී සංශෝධනයන් කිරීමේ හැකියාවක් සංස්ථාවට හිමි වී නොතිබුණි. මෙම තත්ත්වය 2011 අගෝස්තු16 දින පැවැති පොදුව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවධානය යොමුකර හුණුගල් නිධිය පිළිබඳවූ බදු ගිවිසුම නැවත සංශෝධනය කිරීමට උපදෙස් ලබාදුන් නමුත් 2013 අගෝස්තු 31 දින වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) එම බදු ගිවිසුම ඒකපාර්ශවිකව වෙනස් කළ නොහැකිබව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති අතර බදු ගිවිසුම බදු මුදල් වැඩි කිරීම සඳහා සාකච්ඡා පවත්වා ගෙන යනු ලැබේ.

(ආ) සංස්ථාව සතුව පුත්තලම පාලවී හා කල්ලඩි ප්‍රදේශවල තිබූ අක්කර 150 ක පමණ වූ ඉඩම් ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි. මින් අක්කර 09 ක් වූ ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් නිවාස ඉදිකර පදිංචි වී තිබුණි. අනාරක්ෂිත වහා ප්‍රයෝජනයකින් තොරව මෙම ඉඩම් වල් බිහිවී පැවතීම නිසා අනවසර පදිංචි වීම වැලැක්විය නොහැකිවී තිබුණි.

(ආ) මෙම ඉඩමෙහි කිසියම් වගා කටයුත්තක් සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කෙරෙමින් පවතී. ඒ සඳහා යම් මූලික ප්‍රග්ධනයක් අවශ්‍ය බැවින් මූල්‍ය තත්වය යහපත් වූ වහාම ආරම්භ කිරීමට කටයුතු සලස්වනු ලැබේ.

(ඇ) **2003** වර්ෂයේ ණය පදනම මත ලබා දීතිබූසිමෙන්ති මළු **5100** ක් සදහා විකුණුම් නියෝජිත වරයකු ලබා දී තිබූ රු.**1,656,000** ක් වු චෙක්පත් අගරු වී තිබුණි. එම මුදල නෛතික පොලියද සමග අයකර ගැනීමසදහා **2008** පෙබරවාරි **11** දින නඩු පවරා තිබුණි. නඩු තීන්දු ප්‍රකාර නියෝජිතගේ භාණ්ඩ හා දේපල අධිකරණ තහනමට ගන්නා ලද නමුත්එම දේපල වෙන්දේසි කර හෝ සංස්ථාවට වසර **10**ක සිට හිඟහිට පවතින මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ)එම ණයගැතියන් සතු දේපල ලැයිස්තුවක්අධිකරණයමඟින් ලබාගෙන ඇති අතර ඉදිරි වැඩකටයුතු නිම කිරීම සඳහා මූලාධනයක් වැය වන බැවින් මූලා තත්වය යහපත් වූ වහාම එම කටයුතු කඩිනම් කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සදහා අලෙවි නියෝජිත ධූරයන් ප්‍රදානය කිරීමේදී ණයට ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැදුම්කරයක් ලබා නොගැනීම, ණය විය හැකි උපරිම සීමා ගිවිසුමේ සදහන් නොකිරීම, ණය ගෙවීම පැහැර හරින්නන්ගෙන් ණය අයකර ගන්නා ක්‍රමවේදය ගිවිසුමට ඇතුළත් නොකිරීම, ණය ගෙවීමට අපොහොසත්ව තිබියදී නැවත නැවතත්ණයට සැපයීම, බැංකු ඇපකර සදහා ව්‍යාජ තොරතුරු ලබාදීම , අවිධිමත් පරිදි ණය අනුමත කරන ලද නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනීම හා අයවිය යුතු ණය ශේෂ පිළිබඳ පසු විපරම් නොකිරීම වැනි කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගත නොහැකිව තිබූ මුළු ණය ශේෂයරු.**44,467,236** ක්වූඅතර, ඉන් රු. **3,832,137** වසර **09** ක් ඉක්ම වූ පැරණි ණය ශේෂ විය.

(ඇ)මෙම පැරණි ණය ශේෂයන් සඳහා නීතිමය පියවර ගෙන ඇති අතර ඉතිරි ණයගැතියන්ද අයකර ගැනීමට පියවර ගනිමි.

**4.3** ආර්ථික නොවන ගනුදෙනු

සංස්ථාව විසින් රු.**1,088,418,910** ක මුදලක් පෞද්ගලික සමාගම් දෙකක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාවට ලැබී නොතිබිණි.

එම සිමෙන්ති සමාගමේ සිමෙන්ති නිපැයුම් කර්මාන්තශාලාව යාපනයේ පවතින අතර පසුගිය සමයේ උතුරේ පැවතිඅර්බුධකාරී තත්වය හේතුවෙන් එය වසා දමා ඇත. එබැවින් ඔවුන් ලාබ ලබන තත්වයක නොපවතී. එබැවින් සිමෙන්ති සංස්ථාවටද ප්‍රතිලාභයක් ලබා ගැනීම අපහසු තත්වයක පවතී.

## 4.4 අන්තර් ජාතික සමාගමකට වන්දි ගෙවීම -එ.ජ.ඩො. 300,000

| | |
|---|---|
| 1990 වර්ෂයේදී සිමෙන්ති නිෂපාදනයට අවශ්‍ය අමුද්‍රව්‍යක් වන ක්ලින්කර් ආනයනය සඳහා සංස්ථාව විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ස්ථාපිත අනතර්ජාතික සමාගමක් සමග ගිවිසුම් දෙකකට එළැඹී තිබුණි.එකී ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර සමාගම විසින් එ.ජ.ඩොලර් 475,000 ක නාම මාත්‍රබැඳුම්කරයක් ලබා දී තිබූ අතර, සංස්ථාව විසින් දේශීය බැංකුවක් හරහා ක්ලින්කර් ආනයනයට අවශ්‍ය ණයවර ලිපිය විවෘත කර තිබුණි.<br>ගිවිසුම් ප්‍රකාර අවශ්‍ය ක්ලින්කර් සැපයීමට අදාල සමාගම අපොහොසත් වී තිබුණෙන් ඔවුන්ගේ ඉල්ලීම මත සංස්ථාව විසින් ණයවර ලිපි වල කාලය දෙවරක් දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාවේ උන්නතිය හා සිමෙන්ති නිෂපාදනය අඩු වීමෙන් සිදුවිය හැකි පාඩුව අවම කර ගැනීම සඳහා එවැනි ඉල්ලීම් සඳහා තවදුරටත් ඉඩ නොදීම මත හා තිසි පරිදි ක්ලින්කර් සැපයීම සිදු නොකිරීම මත නාම මාත්‍ර බැඳුම්කරය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කිරීමත් සමග සංස්ථාව හා අදාල සමාගම අතර මතභේදයක් හට ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවයම යම් යම් ක්‍රියා මාර්ග ගෙන තිබුණද අවසන් ක්‍රියා මාර්ගයකට එළඹීමට අපොහොසත් වී තිබුණි.<br>මේ පිළිබඳව එවකට සංස්ථාවට අයත් රේඛීය අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව එක්ව දෙපාර්ශවයේම එකඟතාවය ඇතිව 2002 වර්ෂයේදී ලෝකබැංකුවේ බහුපාර්ශවික අන්තර්ජාතික සහතිකවීමේ නියෝජිත ආයතනයේ මැදිහත් වීම මත සංස්ථාව සහ පෞද්ගලික කරන ලද පුත්තලම සිමෙන්ති සමාගම එක්ව ඉහත සමාගමට එ.ජ.ඩො. මිලියන 1.3 ක වන්දියක් ගෙවීමට අවසන් එකඟතාවයට පැමිණතිබුණි. ඒ අනුව පෞද්ගලික සමාගම විසින් එ.ජ.ඩො. මිලියනයක ගෙවා තිබුණු අතර සංස්ථාව විසින් ගෙවිය යුතු හිඟ මුදල අරමුදල් දුෂ්කරතා හේතුවෙන් ගෙවීම ප්‍රමාද කර තිබුණි.<br>කෙසේ නමුත්,අන්තර්ජාතකව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ආරක්ෂාකර ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත වන්දිමුදල් ගෙවීමට 2012 නොවැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඉහත සමාගමට ගෙවිය යුතුඑ.ජ.ඩො.300,000 ට සමාන රු.38,704,668 ක මුදලක් බැංකු ණය පහසුකම් උපයෝගී කරගනිමින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | අයිටාල් ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් ආයතනය වෙතගෙවීමට නියම වූ ඇමරිකානු ඩොලර් 300,000/- ක මුදලභාණ්ඩාගාරයේ අනුමැතිය මත බැංකු ණය පහසුකම් උපයෝගී කරගනිමින් සමාලෝචිත වසරේදී ගෙවා දමන ලදී. |

## 4.5 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිභෝගික සේවා අධිකාරිය විසින් කරන ලද වැටලීමකින් ගල් වූ සිමෙන්ති මළු **6,036** ක් බීසීසී ගබඩාවේද, මළු **8,295** ක් පැලියගොඩ ගබඩාවේද තිබී හමුවී මුද්‍රා තබා තිබුණි. එම ගල් වූ සිමෙන්ති වලින් සංස්ථාවට රු.**9,100,000** ක අලාභයක් සිදු වී තිබුණි.

(අ)ගබඩා පාලක ලෙස නුසුදුස පුද්ගයෙකු පත්කිරීම සහ එතුළින් නිසි ගබඩා පාලනයක් නොතිබුන නිසා මෙය සිදුවිය.

(ආ) නිසි මූල්‍ය කළමනාකරණයක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබු බැංකු අයිරා වෙනුවෙන් රු.**3,395,384** ක බැංකු අයිරා පොලී ගෙවා තිබුණි.

(ආ) බැංකු අයිරා පහසුකම් නොගෙන සිමෙන්ති අලෙවිය සිදු කරීම අපහසු තත්වයක පවතී.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිමෙන්ති මෙට්‍රික් ටොන් **28,249** ක් හෙවත් සිමෙන්ති මළු **576,156** ක් ආනයනය කර තිබුණි. ඉන් මළු **221** ක් අස්ථානගත වී තිබුණි. අස්ථානගත වු මළුවල වටිනාකම රු.**163,578** ක් විය.

## 4.6 ඌණ උපයෝජිත වත්කම්

සංස්ථාව විසින් රු. **550,000** ක මුදලක් වැයකර කන්වේයර් යන්ත්‍රයක් **2011** වර්ෂයේදී මිලදී ගෙන තිබු අතර, ඊට අවශ්‍ය අමතර උපාංග සඳහා රු.**27,429** ක් වැය කර තිබුණි. මිලදී ගත් දින සිටම මෙම යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව තබා තිබුණි.

මෙම යන්ත්‍රය ටෙන්ඩර් කැඳවා විකිණීමට කටයුතු කරනු ලැබේ.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සම්පත්

රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොගත යුතු නමුත් ඊට පටහැනිවසංස්ථාව විසින් රු. **4,800,000** කට මිලදී ගත් කැබ් රථයක්රේඛීය අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා යොදවා තිබුණි.

මෙම කැබ් රථය නැවතත් සංස්ථාවේ අලෙවි කටයුතු ප්‍රවර්ධනය සඳහා ලබා ගැනීමට කටයුතු සලස්වනු ලැබේ.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව අදාල වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, **2012** වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස **05** ක ප්‍රමාදයකින් පසුව **2013** අගෝස්තු **15** දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

| | |
|---|---|
| 2011- 2015 වර්ෂ පහ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි සඳහන් මෙහෙවර , දැක්ම හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. කෙසේ වෙතත්, කලකට ඉහතදී දිවයිනේ එකම ප්‍රමුඛතම සිමෙන්ති නිෂ්පාදකයා හා අළෙවිකරුව සිටි සංස්ථාව අද වන විට සිමෙන්ති නිෂ්පාදනය මුළුමනින්ම නවතා දමා සිමෙන්ති ආනයනය කිරීමට පමණක් සීමාවී තිබුණි. සංයුක්ත සැලැස්ම සහ කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව එසේ කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ට අයත් සිමෙන්ති නිපැයුම් කර්මාන්තශාලාව යාපනයේ පවතින අතර එහි පැවතිඅර්බුධකාරි තත්වය කරුණු කොටගෙන 1990 වසරේ සිට එය වසා දමා ඇත. එවැනි තත්වයක් උඩ ශ්‍රීලංකා සිමෙන්ති සංස්ථාවට සිමෙන්ති ආනයනය කර බෙදා හැරීම සිදු වී ඇත. මෙම වසරේදී සිමෙන්ති සංස්ථාවේ සංයුක්ත සැලැස්ම සමාලෝචනය කිරීමට පියවර ගනු ලැබේ. |

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

| | |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් 2012 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මෙම වසරේදී ඉදිරි වර්ෂයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරන්නෙමු. |

## 5.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ 2012 වර්ෂයට අදාල කාර්ය මණ්ඩලය පිළිබද විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 07 | 08 | - | 01 |
| විධායක නොවන | 24 | 16 | 08 | - |
| වෙනත් | 45 | 38 | 07 | - |
| **එකතුව** | 76 | 62 | 15 | 01 |

| | |
|---|---|
| අනුමත නොමැති විධායක ශ්‍රේණියේ එක් තනතුරක අතිරික්තයක් පැවතීම ගැටළුකාරී වුවත්, විධායක නොවන මට්ටමේ පුරප්පාඩු 08 ක් සමඟ වෙනත් පුරප්පාඩු 07 ක් පැවතීම සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට අභියෝගයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම තනතුරු පුරවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ මූල්‍ය තත්වය එතරම් යහපත් නොවන බැවින් විධායක නොවන මට්ටමේ පුරප්පාඩු පිරවීම දැනට කල්තබා ඇත. |

## 5.5 අයවැය පාලනය

| | |
|---|---|
| අයවැය ගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | මෙම වසරේදී අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. |